www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: කුමන්ත්‍රන චෝෂාවට හරස් කපමින් විපක්ෂ ආධාරකරුවන් නිදහස් කෙරේ

**Sri Lanka: Release of opposition supporters undermines "coup" claims**

සරත් කුමාර විසිනි
2010 පෙබරවාරි 22

ජනවාරි 26 දින ජනාධිපතිවරනයෙන් පසුව රඳවාගෙන සිටින විපක්ෂයේ ජනාධිපති අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකාගේ ආධාරකරුවන් 14 දෙනෙක්, මහේස්ත්‍රාත් අධිකරනය විසින් පසුගිය සතියේදී නිදහස් කරන ලදී. ආන්ඩුව හා රාජ්‍ය සතු මාධ්‍ය, නොවැම්බර් මාසය දක්වාම රටේ ප්‍රධාන ජෙනරාල්ව සිටි ෆොන්සේකා, ජනාධිපති මහින්ද රාජපක්ෂ පෙරලා දැමීමට කුමන්ත්‍රනය කල බවට චෝදනා නැගූහ.

කිසිදු රැඳවියෙකුට විරුද්ධව චෝදනා ගොනු කිරීමට තරම් සාක්ෂි නොමැති බව පිලිගැනීමට පොලිසියට බලකෙරුනු තත්වය තුල පෙබරවාරි 17 දින, අධිකරනය ඔවුන් නිදහස් කිරීමට නියෝග කලේය. තීන්දුව මඟින්, විපක්ෂයේ ආධාරකරුවන් මත දිගින් දිගට සිදු කෙරෙන කඩාපැනීම් මෙන්ම, පෙබරවාරි 08 දින ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට ආන්ඩුව ගත් තීරනය සඳහා ද රාජපක්ෂ දැමූ කඩතුරාව ඉරා දමනු ලැබිනි.

ජනවාරි 29 දින සිය ගනනක් පොලිස් භටයන් ෆොන්සේකාගේ මැතිවරන කාර්යාලය වැටලූ අවස්ථාවේ, විශ්‍රමික හමුදා නිලධාරීන් 10 ද ඇතුලුව පුද්ගලයින් 14 ක් අත්අඩංගුවට ගනු ලැබිනි. පොලිස් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව හෙවත් සීඅයිඩීය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ ඔවුන් දින 19 ක් තිස්සේ රඳවාගෙන ප්‍රශ්න කරන ලදී. නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් යුක්තිසහගත කිරීම සඳහා කථා ගෙතීම සම්බන්ධයෙන් සීඅයිඩීය නමක් උසුලයි. මේ සිද්ධියේදී කොලඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරිය වන චම්පා ජානකී රාජරත්න, ආන්ඩුවට විරුද්ධව සාපරාධී කුමන්ත්‍රනයක යෙදුන බවට ඔවුන්ට විරුද්ධව කිසිදු සාක්ෂියක් සොයාගත නොහැකිවූ බව සීඅයිඩීය විසින් දැනුම් දීමෙන් පසුව, ඔවුන් නිදහස් කලාය.

මිලිටරි පොලිසිය විසින් නාවික හමුදා මූලස්ථානයෙහි තවමත් ෆොන්සේකා රඳවාගෙන සිටියි. ඔහුට විරුද්ධව චෝදනා ගොනුකොට නැත. ඔහුගේ නීතිඥ විජේදාස රාජපක්ෂ මාධ්‍ය වෙත ප්‍රකාශ කලේ, යුධ අධිකරනය සමඟ සහයෝගී නොවීමට ෆොන්සේකා තීරනය කර ඇති බවයි. ''කුමන්ත්‍රන'' වැයමක යෙදී සිටියේ යයි කියා සිටි ෆොන්සේකාගේ සමීප ආධාරකරුවන් හා අනෙකුත් අයට එරෙහි චෝදනා හකුලා ගැනීමෙන්, ෆොන්සේකාටම එරෙහි නඩුව ද ප්‍රශ්නයට බඳුන්වෙයි.

විරුද්ධ පක්ෂයේ අනෙකුත් ආධාරකරුවන්ට එරෙහි නඩු ද අර්බුදයට ගොස් තිබේ.

*සීඅයිඩීය චෝදනා නැඟීමට අසමත් වීම නිසා, ලංකා පත්‍රයේ චන්දන සිරිමල්වත්ත පෙබරවාරි 16 දින ගංගොඩවිල මහේස්ත්‍රාත් විසින් නිදහස් කරන ලදී. ජනවාරි 29 දින ඔහු අත්අඩංගුවට ගනු ලැබුවේ සීඅයිඩී වෙත කට උත්තරයක් දීමට පැමිනි අවස්ථාවේය. ඔහු නිදහස් කිරීමට පෙර දිනයේ ඔහුගේ බිරිඳ ශ්‍රේෂ්ඨාධිකරනයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකර තිබුනි.

ලංකා යනු, මැතිවරනයේදී, එක්සත් ජාතික පක්ෂය සමඟ ෆොන්සේකාට පිටුබලය දුන් සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ පුවත් පතයි. සිරිමල්වත්ත අත්අඩංගුවට ගත් දිනට පසු දිනයේදී සීඅයිඩීය, කිසිදු යුක්තිසහගත කරුනු දැක්වීමකින් තොරව පුවත්පත් කාර්යාලයට මුද්‍රා තැබීය. දෙදිනකට පසුව ගංගොඩවිල මහේස්ත්‍රාත් වරයා තහනම අහෝසි කලේය.

නිදහස්වීමෙන් පසුව පැවැත්වූ මාධ්‍ය හමුවේදී සිරිමල්වත්ත පැවසුවේ, බේරීමට ලැබීම තමාගේ වාසනාවක් බවත්, ඔහුට ද ලංකා-ඊ-නිව්ස් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩට අත්වූ ඉරනම හිමිවීමට ඉඩ තිබූ බවත්, සීඅයිඩී නිලධාරියෙක් තමන්ට පැවසූ බවයි. ජනාධිපතිවරනයට දින කිහිපයකට පෙර අතුරුදහන්වූ එක්නැලිගොඩ ඉන් පසුව දක්නට ලැබී නැත. පසුගිය සිවි වසර තිස්සේ ආන්ඩු ගැති ඝාතක කල්ලි විසින් මාධ්‍යවේදීන් ද ඇතුලුව සිය ගනනක් අතුරුදහන්කර හෝ මරාදමනු ලැබ ඇත.

*පෙබරවාරි 11 දින කොලඹ මහේස්ත්‍රාත් වරිය, ඊට පෙර දින ප්‍රධාන අධිකරන පරිශ්‍රයට පිටතදී විපක්ෂයේ විරෝධතා කරුවන් අත්අඩංගුවට ගැනීම පිලිබඳව

පොලීසිය විවේචනය කලාය. ඇය පෙන්වා දුන්නේ, විරෝධතාවට පහර දුන් ආන්ඩු ගැති සන්නද්ධ මැරයන් අත්අඩංගුවට ගැනීම වෙනුවට පොලීසිය, හිතුවක්කාරී ලෙස පොදු හා පෞද්ගලික දේපලවලට අලාභහානි සිදුකිරීම හා පාරේ ගමන්කල අයට තුවාල සිදුකිරීම සම්බන්ධයෙන්, විරෝධතාකරුවන් අටදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බවයි. මහේස්ත්‍රාත්වරිය අටදෙනා ඇප මත මුදාහැරිය අතර මැරයන් අත්අඩංගුවට ගන්නා ලෙස පොලීසියට නියෝග කලාය.

දින කිහිපයකට පසුව අනුරාධපුර මහේස්ත්‍රාත් වරයා, ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට එරෙහිව විරෝධතාවයේ යෙදුනු කන්ඩායමකට පහරදුන් ආන්ඩු ගැති මැරයන් වෙනුවට, විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීම පිලිබඳව පොලීසියට තරවටු කලේය.

*පෙබරවාරි 17 දින සීඅයිඩීය, ෆොන්සේකාගේ බෑනනුවන්ගේ මව වන අශෝකා තිලකරත්න, රුපියල් මිලියන 75 ක් වටිනා ඇම. ඩොලර් 655000 ක් ලඟ තබාගත්තේය යන චෝදනාව මත අත්අඩංගුවට ගත්තේය. ''ත්‍රස්තවාදී සම්බන්ධකම්'' පිලිබඳව ප්‍රශ්න කිරීම සඳහා ඇය රිමාන්ඩ් භාරයේ තැබීමට පොලීසියට අවශ්‍ය වුවත්, මහේස්ත්‍රාත්වරයා එය ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ චෝදනාව එල්ලවන්නේ විදේශ හුවමාරු නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් බවයි.

මෙරට ආරක්ෂක හමුදා, රාජ්‍ය නිලධරය, පෙලීසිය හා අධිකරනය යන සියල්ල දේශපාලනීකරනය වී තිබේ. පෙලීසිය විපක්ෂ ආධාරකරුවන්ට එරෙහිව චෝදනා ගොනුකිරීමට අසමත්වීම පිලිබඳව මහේස්ත්‍රාත්වරුන්ගේ තරවටු කිරීමට නැත්නම් අවවාද කිරීමට ලක්වීමේ කාරනය පෙන්නුම් කරන්නේ, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා නීතිය පිලිබඳ උත්සුකයකට වඩා, රාජ්‍ය යාන්ත්‍රනය තුල ඇතිව තිබෙන ආන්ඩු විරෝධී මනෝභාවයන්ය.

*ෆොන්සේකාගේ අත්අඩංගුවට ගැනීම, සිංහල=බෞද්ධ සංස්ථාපිතය තුල ද බෙදීම් ඉස්මතු කර තිබේ. ප්‍රධාන බෞද්ධ නිකායන් තුනේ මහ නාහිමිවරු ජෙනරාල් වහා නිදහස් කරන ලෙස ඉල්ලා පෙබරවාරි 13 දින ප්‍රකාශයක් නිකුත් කිරීම අසාමාන්‍ය පියවරකි. ජනාධිපති වෙත යොමුකල ලිපියක ඔවුහු මෙසේ ලිවූහ. ''රටේ ඒකීය භාවය සඳහා සිය ජීවිතය පරදුවට තබා කටයුතු කල හිටපු හමුදා ප්‍රධානී, ජෙනරාල් සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම, කිසිදු තත්වයක් යටතේ අපි අනුමත නොකරන බව කීමට කැමැත්තෙමු.''

එල්ටීටීඊ යට විරුද්ධව රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධය නිර්ධය ලෙස ක්‍රියාත්මක කලේ, ජෙනරාල් ෆොන්සේකා විසිනි. මේ පුද්ගලයන් දෙදෙනාම යුද අපරාධ සම්බන්ධයෙන් මෙන්ම මිලිටරිය විසින් ගෙන ගිය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරිම් පිලිබඳව ද වගකිව යුතුය. රටේ වර්ගවාදී ව්‍යවස්ථාවේ ප්‍රතිඵල වශයෙන්, බෞද්ධ සංස්ථාපිතය වරප්‍රසාදිත තත්වයක් භුක්ති විඳින අතර, රාජපක්ෂට හා යුද්ධයට ප්‍රර්න පිටුබලය ලබාදුන්නේය. එහෙත් එය, පාලක පැලැන්තිය තුල පුපුරාගිය කර්කෂ කන්ඩායමික කාකොටා ගැනීම් පිලිබඳව පැහැදිලිවම නොසතුටට පත්ව සිටියි.

ප්‍රධාන බෞද්ධ නිකායන් හතරේ නායක හිමිවරු, තත්වය ගැන සාකච්ඡා කිරීම සඳහා පෙබරවාරි 18 දින මහනුවරදී විශේෂ සංඝ සමුලුවක් කැඳවා තිබුනු නමුත්, වාර්තාවූ පරිදි ආන්ඩුවේ බලපෑම් මත, පසුව අතහැර දමන ලදී. නිකුත් කල ප්‍රකාශයක මහ නාහිමිවරු කියා සිටියේ, ''භික්ෂූන්ගේ හා දායකයන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගැනීමට'' තමන්ට සිදුවූ බවයි. එය වනාහි, සමුලුවට ආන්ඩු ගැති මැරයන්ගේ ප්‍රහාර එල්ල වීම ගැන සිය කනස්සල්ල ප්‍රවේශම් සහගතව ප්‍රකාශ කිරීමක් විය.

ආන්ඩුව හා විපක්ෂ කඳවුර අතර මතුව තිබෙන තියුනු දේශපාලන මතභේද, උපායික මිස මූලධර්මාත්මක ස්වභාවයේ ඒවා නොවේ. ඒවා වනාහි කොලඹ තුල ආනුභාවය පැතිරවීම සඳහා ප්‍රතිමල්ලව මහා බලවතුන් අතර වැඩෙන උත්සුකයන්ගේ ප්‍රතිරාවයකි. රටේ සිවිල් යුද්ධයේ කාලය තුල විශේෂයෙන්ම චීනය, රාජපක්ෂ තන්ත්‍රයට ආයුධ, මූල්‍යාධාර හා රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලබාදෙමින් වාසි ලබාගැනීම පිලිබඳව එක්සත් ජනපදය හා එහි සගයන්, උරනවී සිටියි.

රාජපක්ෂ, අප්‍රේල් 08 දිනට මහ මැතිවරනය ප්‍රකාශ කර ඇති අතර, එහි අරමුන ව්‍යවස්ථාව වෙනස්කිරීම සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ලබා ගැනීමයි. පාලක හවුල ප්‍රකාශ කරන්නේ, තමන් ස්ථාවර ආන්ඩුවක් පිහිටුවීම සඳහා ව්‍යවස්ථාවේ වෙනස්කම් ඇතිකරන බවයි. එහෙත් එහි සැබෑ අරමුන වන්නේ, තමන් ගැනීමට බලාපොරොත්තු වන දුර දිග යන සීමා පැනවීම් මත වැඩකරන ජනතාව සමඟ ගැටුමක් සඳහා සූදානම් වීම් වස්, ආන්ඩුවේ ආඥාදායක පාලන ක්‍රමෝපායන් ශක්තිමත් කර ගැනීමයි.

.

© www.wsws.org